නමැති කවි පංතියෙන් උපුටාගත් කවක් මෙම විරිතට උදාහරණයක් ලෙස පහත දැක්වේ.

හමන විටදි සිහිල් සුළඟෙ රැලී
නොමඳ සුවය දැනෙයි ගතට ඇලී
නමුදු නැගෙන සිතුම් සොවින පෙළී
රැඳුන සතුට මකයි කඳුළ සැලී

එමෙන්ම පහත දැක්වෙන කවියද දියකේලි විරිතට උදාහරණයකි.

නිතර නිතර වුණේ දබර නිසා
නැගෙන හඬකි දුකේ සතර දිසා
හඬන අයද ඇතේ ගෙවන දසා
බලනු මැනවි පුතේ නොකිය දොසා

**දොඹ විරිත:**

පාදයක් මාත්‍රා දහයකින් පසුව ලඝුවක් ද පසුව විරාමය ද නැවත මාත්‍රා තුනකින් පසුව ලඝුවක් ද ඒ ලඝුවෙන් පසුව විරාමය ද වෙනත් ගුරු ලඝු නියමයක් නැද්ද එම විරිත දොඹ විරිත වේ. පහත දැක්වෙන කවිය දොඹ විරිතට නිදසුනකි.

රුවැති මලක් වගෙ උදයෙ හිනැහෙන
මිහිරි ගී ගයා සැවොම සනසන
සිඟිති කෙලි පැටී අපගෙ පණ මෙන
යනව ගුරු ගෙදර අකුරු කරවන

**සක්වා විරිත:**

පාදයක මාත්‍රා සතකින් පසුව ගුරු ලඝු දෙකක් ද පසුව පාද මධ්‍ය විරාමය ද, නැවත මාත්‍රා තුනකින් පසුව ගුරු ලඝු දෙකක් ද පසුව පාදාන්ත විරාමය ද වෙතොත් එය සක්වා විරිත නම් වේ. සක්වා විරිතට උදාහරණයක් ලෙස තිසර සංදේශයේ එන පහත සඳහන් කවිය පෙන්විය හැක.

බට ගඟුලැලි පෙළාන පැහැ දුළාන
දිගු තුඟු ගිරි කුළාන විලසළාන
බබළන දළ දළාන මද ගළාන
දකු මත ගජ රළාන වන ගළාන

පහත දැක්වෙන්නේ සක්වා විරිතට තවත් නිදසුනකි.

කොටි වලසුන් රඟේය මග දිගේය
හඬනා'යුරු අගේය රැව් නැගේය
අනතුර ළඟ වගේය සැක මගේය
අවි ගන්නට හැඟේය අඩි උගේය

**තරඟවැල විරිත:**

පාදයක් පිළිවෙළින් 'බ' ගණ තුනකින් සහ ගුරු දෙකකින් බඳිනා ලද්දේ නම් එය තරඟවැල විරිත වේ. මෙහි විරාමය පාදාන්තයේය. තිසර සංදේශයෙහි එන පහත පෙනෙන කවිය තරඟවැල විරිත සඳහා නිදසුනකි.

වන් නෙත සවි සත සිත් තොස රැන්දූ
රන් ලිය වන් ලෙළ සිව්මැල ළන්දූ
මන් ලෙස දෙත් රඟ රැව්දෙන නන්දූ
උන් දැක නෙත් තොප ලත් පල වින්දූ

පහත දැක්වෙන්නේ තරඟවැල විරිත සඳහා තවත් උදාහරණයකි.

ලස්සන දිස්වෙන රූපෙකි එන්නේ
විස්මිත රශ්මිය දෑසිනි දෙන්නේ
ගැස්සෙන ඉස්සෙන තාලෙට යන්නේ
සිත්කලු නෙත්කලු නාරියො ඉන්නේ

**තෝටක විරිත:**

පාදයක් පිළිවෙළින් 'ස' ගණ සතරකින් බඳිනා ලද්දේ නම් එය තෝටක විරිත නම් වේ. මෙහිද විරාමය පාදාන්තයේය. තිසර සංදේශයේ එන පහත දැක්වෙන කවිය තෝටක විරිත සඳහා උදාහරණයකි.

සොබනා රුවිනා මදනා දිනනා
දකිනා මතිනා ලියනා පතනා
සුරනා නළනා ලෙසිනා රඟනා
නරනා නතනා ම විනා කෙවනා

තෝටක විරිතට තවත් නිදසුනක් පහත දැක්වේ.

විරසා සිතිනා වෙසෙනා දෙදෙනා
නරනා පිණිසා කඩුගා ගැටෙනා
නව ලෝ සුදනා පිදුරූ දමනා
නොඑනා ගමනා දිනනා සටනා

**පෙද විරිත:**

පාදයක් ගුරු ලඝු භේදයකින් තොරව මාත්‍රා දහසයකින් යුක්තව සහ මත්‍රා සතරෙන් සතර විරාම ස්ථාන තබා ඇත්නම් එය පෙද විරිත දැක්වේ. එලු සඳස් ලකුණ පොතෙහි එන පහත දැක්වෙන කවිය පෙද විරිතට උදාහරණයකි.

ඉඳුදුනු විදුලිය මේ ගැබ රැඳියේ
සිකි පිල් වටමින් ගිරිහිස රැඳියේ
සහමල් කොලඹිඑ නල මඳ රැඳියේ
කිම මද මියුලැස මෙනෙ දැන් රැඳියේ

එලෙසම පහත දැක්වෙන කවිය ද පෙද විරිතට නිදසුනකි.

ඉඟ වට සේලය හැඩකර ඇඳලා
නළලට කුංකුම තිලකය තියලා
කිංකිණි හඬ දෙන ගිගිරිත් පටලා
රූසිරි නළඟන සබ මැද නටලා

ඉහතින් දැක්වූයේ සෙල් සහ ගජ ඡන්දස් දෙකට අයත් ප්‍රචලිත විරිත් කිහිපයකි. තවත් විරිත් ඇති අතර ඒ සියල්ලම මෙහි සඳහන් කිරීමෙන් කිසියම් වූ ඒකාකාරී බවක් ඇති විය හැක. එනිසා වැඩිදුර අධ්‍යනයට කැමැත්තෝ නියමිත ග්‍රන්ථ ඇසුරු කරන්නේ නම් මැනවි.



## ඩී.බී. කුරුප්පු වියතානනි

සිරිත විරිත මව්බස සිංහල කම
පිරුණු රසය සාහිතයේ උගත් කම
ඇරුණු පියන්පත් හදවත් දොර ඉම
කුළුණකි ඔබ මහ පඬිරුවනක් සම

තම අදහස් සිය පන්හිඳ හරහා
ලියූ කතුවරයා පොත පත හරහා
පොත්ගුල අබියස දුක ඇත විරහා
නැවතත් එනු මැන මව් කුස හරහා

සිටුවා ගස් අතු මල්වැල් ඔස්සේ
ඔබේ දැනුම මිණී දියරෙන් ඉස්සේ
වැරදී දිව ගිය මංපෙත් ඔස්සේ
ඔබ හඬ ළඟ සැම හදවත් ගැස්සේ

දම්මි සුගත්ලා නැත උපදින්නේ
පැරණී කතන්දර කව්ද කියන්නේ
ගුරු හරු කම් කාගෙන් අහගන්නේ
වියතුන් ඔබ වැනි නැත බිහිවන්නේ

ලක්මව් කුස යස විරුවන් එක්කා
එඩිතර කම හරි හරියට රැක්කා
සිසු සිසුවියනගෙ යහමඟ එක්කා
තක්ෂිලාව ඔබ ඇවිදිනු දැක්කා

වසරක් ගෙවුනිය ඔබ අප හැරදා
සිහි කරනෙමි නෙත කඳුලැලි පිහදා
අනියත ලෝ දම සිහියෙන් විසඳ
ඔබට "නිවන් සුව" පතනෙමි සැමදා

ඩේසි ද සිල්වා

